| | | | | |
|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | ) 0112669192 , 0112675011<br>) 0112694033, 0112675280<br>) 0112675449 | | මගේ අංකය<br>எனது இல<br>My No. | )<br>)<br>) CF/EXC/02/2025 |
| ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | ) 0112693866<br>) 0112693869<br>) 0112692913 | | ඔබේ අංකය<br>உமது இல<br>Your No. : | )<br>)<br>) |
| විද්‍යුත් තැපෑල<br>மின்னஞ்சல் முகவரி<br>e-mail | )postmaster@health.gov.lk<br>)<br>) | සුවසිරිපාය<br>சுவசிரிபாய<br>SUWASIRIPAYA | | |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>website | ) www.health.gov.lk<br>)<br>) | | දිනය<br>திகதி<br>Date | )<br>) 2024/12/.24<br>) |

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

**පොදු චක්‍රලේඛ ලිපි අංක** :- 02 - 01 /2025

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල - කොළඹ 10,
අධ්‍යක්ෂ - ජාතික රෝහල - මහනුවර,
අධ්‍යක්ෂ - ජාතික රෝහල - ගාල්ල,
රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පි II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙපාර්තමේන්තු පරීක්ෂණය - 2025 (පළමු වාරය)**

මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පි II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණිය නිලධාරීන් II ශ්‍රේණියට නියමිත වැටුප් පරිමාණයේ හතර වැනි වැටුප් පියවරට එළඹීමට පෙර සමත්වියයුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් **2025/03/01** හා **2025/03/02** දිනයන්හිදී පවත්වනු ලබන බවද, දෙපාර්තමේන්තු පරීක්ෂණය මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02. සුදුසුකම්**

මෙම විභාගයට අයදුම් කළ හැක්කේ මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පි තනතුරේ II "අ" ඛණ්ඩයට / II ශ්‍රේණියට පත්වීම් ලද හා මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට පමණි.

**සැ.යු :-2025/01/17 දින වන විට II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියට පත්කර අදාල පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න. (II ශ්‍රේණියට පත්කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමග අමුණා එවීම අනිවාර්ය වේ.)**

**03. අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව අයදුම්කරුවන් විසින් සකස්කර ගතයුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385 "සුවසිරිපාය"සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (විභාග) වෙත **2025/01/17** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙලවරෙහි **"මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙපාර්තමේන්තු පරීක්ෂණය - 2025 (පළමු වාරය)"** ලෙස සඳහන් කළ යුතුය. **මෙම කර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියා විසින්ද, සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු සියල්ල නිවැරදි බවට ආයතන ප්‍රධානියා විසින්ද සහතික කර තිබීම අනිවාර්යය වේ.** තම අයදුම්පත සමඟ රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.110.00 ක් වටිනා මුද්දර ඇලවූ 9"X 4" ප්‍රමාණයේ ලියුම් කවර 02ක් ද එවිය යුතුය. **ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සැ.යු. :- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**04. විභාග ගාස්තු -**

I. විභාගයට පළමුවරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තු වලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකල මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළයුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

**05.** **විභාගයට ඇතුලත් කර ගැනීම.**

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළයුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) සෞඛ්‍ය අමාත්‍යංශයේ හෝ ඊට අදාල ආයතනයන් මගින් විධිමත් ලෙස නිකුත් කරණු ලබන හැඳුනුම්පත
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

**06.** **විභාග පරිපාටිය**

මෙම විභාගය දෙපාර්තමේන්තු පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යනුවෙන් කොටස් දෙකකි. දෙපාර්තමේන්තු පරීක්ෂණය, **ලිඛිත, වාචික සහ ප්‍රායෝගික** වශයෙන් කොටස් තුනකින් යුක්ත වන අතර, එක් එක් කොටස සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම කොටසකට අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය **ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති** යනුවෙන් සහ **මුල්‍ය ක්‍රම** ලෙස විෂයන් දෙකකින් සමන්විත වන අතර විෂයන් දෙකටම ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

එක්වරකදී හෝ කිහිපවරකදී විෂයන් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයයන් අයදුම් කළ යුතුය.

**07.** **විෂය නිර්දේශ මාලාව**

**7.1** **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

**7.1.1 ආයතන සංග්‍රහය**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය දෙකකි. රචනා මාදිලියේ ප්‍රශ්න හතකින් (07) සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුයි.

**ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.**

| | | |
|---|---|---|
| XV වන පරිච්ඡේදය | - | අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම. |
| XVI වන පරිච්ඡේදය | - | නිවාඩු ගමන් |
| XXIII වන පරිච්ඡේදය | - | ඇතැම් වර්ග වල රෝගවලින් පෙලෙන රජයේ නිලධාරියන්ට විශේෂ අනුග්‍රහය හා ඒ පිළිබඳ කොන්දේසි |
| XXIV වන පරිච්ඡේදය | - | වැටුප් ණය සහ අත්තිකාරම් |
| XXV වන පරිච්ඡේදය | - | වෘත්තිය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහය. |
| XXVII වන පරිච්ඡේදය | - | ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග. |
| XXVIII වන පරිච්ඡේදය | - | පරිපාලන කාර්ය පරිපාටි සහ විධි. |
| XXX වන පරිච්ඡේදය | - | රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව ආණ්ඩුව සතු බලතල. |
| XXXIII වන පරිච්ඡේදය | - | නීති උපදෙස් සහ නීති ක්‍රියාමාර්ග. |
| XLVII වන පරිච්ඡේදය | - | සාමාන්‍ය හැසිරීම සහ විනය |
| XLVIII වන පරිච්ඡේදය | - | විනය කාර්ය පරිපාටිය |

**7.1.2 මුදල් රෙගුලාසි**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය දෙකකි. රචනා මාදිලියේ ප්‍රශ්න හතකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුයි.

**මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද.**

VI වන පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිමය සහ බැංකු ගිණුම්, රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව, බැංකු ගිණුම් (මුදල් රෙගුලාසි 315 සිට මුදල් රෙගුලාසි 396 දක්වා)

XIII වන පරිච්ඡේදය - සැපයීම් වැඩ සහ සේවා සැපයීම් මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණ, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරවීම, (මුදල් රෙගුලාසි 708 සිට මුදල් රෙගුලාසි 775 දක්වා)

7.2 දෙපාර්තමේන්තු පරීක්ෂණය

7.2.1 විෂයානුබද්ධ ලිඛිත

විෂය ක්ෂේත්‍රයට අදාල පැය තුනක (03) ප්‍රශ්න පත්‍රය රචනා මාදිලියේ ප්‍රශ්න අටකින් (08) සමන්විත වන අතර ඉන් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුයි. ලකුණු 100 කි.

**විෂය නිර්දේශය**

i මැලේරියා, බරවා, ශ්වසන රෝග, ලිංගාශ්‍රිත රෝග, ඒඩ්ස්, ලාදුරු, යන විෂය ක්ෂේත්‍ර

ii රසායනාගාර කළමනාකාරිත්වය

7.2.2 විෂයානුබද්ධ ප්‍රායෝගික - විෂය ක්ෂේත්‍රයට අදාලව හැකියාවන්, ක්‍රියාකාරකම් හා බැඳුනු ප්‍රායෝගික පරීක්ෂණයකි. විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණයට අදාලවන විෂය නිර්දේශය මෙයටද අදාල වේ. ලකුණු 100කි. කාලය පරීක්ෂණය අනුව තීරණය වේ.

7.2.3 විෂයානුබද්ධ වාචික - විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රයට අදාල විෂය නිර්දේශයට අදාලව සහ සේවයේ යෙදීමේදී එළඹිය හැකි ගැටළු පිළිබඳව වාචික පරීක්ෂණයකි. ලකුණු 100කි. කාලය විනාඩි 15 කි.

**08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදවි කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදවි ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

**09.** කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ අදාළ නිලධාරීන්ට දැනගැනීමට සලස්වන්න. (මෙම **තොරතුරු** www.health.gov.lk **වෙබ් අඩවියෙන්ද ලබාගත හැකිය.)**

**Web Path :- www.health.gov.lk → Staff Access → Administration → Examination → Circulars**

**සැ. යු. මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවක් මතුවුවහොත් සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.**

යූ ඒ එස් එච් සිසිර කුමාර

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II

ලේකම් වෙනුවට

යූ.ඒ.එස්. හර්ෂප්‍රිය සිසිර කුමාර

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 02

සෞඛ්‍ය අමාත්‍යාංශය,

"සුවසිරිපාය"

කොළඹ 10

**EXC**

ආදර්ශ අයදුම්පත

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

**<u>මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙපාර්තමේන්තු පරීක්ෂණය - 2025 (පළමු වාරය)</u>**

01. (අ) I. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) - ..............................................................................

..............................................................................................................................

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රිසි කැපිටල් අකුරින්) -

III. මුලකුරු සමඟ නම (සිංහලෙන්) - ..............................................................................

..............................................................................................................................

IV. මුලකුරු සමඟ නම (ඉංග්‍රිසි කැපිටල් අකුරින්) -

(ආ) I. "අ" ඛණ්ඩයට / II ශ්‍රේණියට උසස් කල දිනය - ..............................................................

ලිපි අංකය -..............................................................................

**(II ශ්‍රේණියට පත්කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමග අමුණා එවීම අනිවාර්ය වේ.)**

II. දැනට ලබන වාර්ෂික වැටුප - ..............................................................................

III. ජාතික හැඳුනුම්පත් අංකය -

IV. ජංගම දුරකථන අංකය -

V. විද්‍යුත් ලිපිනය - ..............................................................................

02. ඔබ මෙවර පෙනිසිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුල (√) ලකුණ යොදන්න. පෙනි නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටික රීති

මුදල් රෙගුලාසි

විෂයානුබද්ධ ලිඛිත

විෂයානුබද්ධ ප්‍රායෝගික

විෂයානුබද්ධ වාචික

03. (අ) දැනට සේවය කරන ආයතනය :– සිංහලෙන්..............................................................................

ඉංග්‍රිසියෙන් ..............................................................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ :– රේඛීය අමාත්‍යාංශයට පළාත් සභාවට

(ඇ) පළාත් සභාවට නම් අදාල පළාත :– ..............................................................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය :–..............................................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9"×4" ප්‍රමාණයේ රු 110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 02ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද ? ..............................................................................

(ඊ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) - ..............................................................................

..............................................................................................................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රිසි කැපිටල් අකුරින්) - ..............................................................................

..............................................................................................................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/දෙමළ/ඉංග්‍රිසි) - ..............................................................................

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ..........................................................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේනම් මුද්දර අලවා තිබේද?

| මුද්දර කොටුව |
| --- |

06. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම ආයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වරට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වරට නොවන බැවින් රු.....................ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම අයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකග වන බවත් මෙයින් සහතික කරමි.

..........................................

දිනය .......................................... අයදුම්කරුගේ අත්සන

07. **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ සහතිකය**

මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර/ පසු මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

.......................................

දිනය :-........................................................... නම සහ අත්සන

08. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

...........................................................................................මයා/මිය/මෙනෙවිය*...............................................................

නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වරට / නොවන* බවටද, රු............ක් වටිනා මුද්දර මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවද / මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොණුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි. මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි

.................................

දිනය :- .................................... ආයතන ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

09. **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

..................................................... මයා/මිය/මෙනවිය, මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පි II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණිය **මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පි** නිලධාරියකු/ නිලධාරිණියක වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ........................... ..............................................

විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

(* අනවශ්‍ය කොටස් කපා හරින්න.)